# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2016 මාර්තු මස 08 වන අඟහරුවාදා

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි**
**බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම**

පූ.භා. 09.30 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

**●පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණි | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු ගුණසිරි ජයනාත් | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

| | | |
|---|---|---|
| අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා | ජනක දීපාල් වැලිවත්ත | රවීන්ද්‍ර යසස් කුමානායක |
| අනුරුද්ධ ලේකම්ගේ | ජයන්ත ද සිල්වා | රොජර් සෙනෙවිරත්න |
| අසෝක රන්වල | ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර | රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර් |
| අශෝක දයාරත්න | තුවාන් ආමිත් මොහමඩ් අක්රම් | රොයිස් විජිත |
| අර්ෂාඩ් නිසාම්ඩීන් | තෙබුවන පියනන්ද හිමි | රෝස් ප්‍රනාන්දු මෙනෙවිය |
| ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර් | නව්සර් ෆව්සි | ලක්ෂ්මන් නිපුණ ආරච්චි |
| ඊ.ඒ. නන්දන පත්මකුමාර | නිමල් ආර්. පීරිස් | ලයනල් ජයසිංහ |
| උදේන විජේරත්න | නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන | ලලන්ත ගුණසේකර |
| උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ | නිරෝෂන් පාදුක්ක | ලලිත් එල්ලාවල |
| එම්.එස්.එම්. රහීම් | නිශාන්ත ශ්‍රී වර්ණසිංහ | ලලිත් වර්ණකුමාර |
| එස්.ඒ. සමන්මලී සකලසූරිය මෙනෙවිය | පී.ආර්.පී. අබේගුණවර්ධන | ලෙනාඩ් කරුණාරත්න |
| එස්. කුහවරදන් | පී.ඩී. අබේරත්න | සරත් පතිරණ |
| එස්.එම්. සකාවුල්ලා | ප්‍රදීප් උඳුගොඩ | සරත් සුමනසේකර |
| ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව | ප්‍රදීප් පෙරේරා | සලෝචන ගමගේ |
| කාමල් කුරුප්පු | බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන | සහන් ප්‍රදීප් |
| කිත්සිරි කහටපිටිය | මහින්ද ජයසිංහ | සිරිකමල් පිලිෂියන් ද සිල්වා |
| කීර්ති කාරියවසම් | මහේෂ් අල්මේදා | සුසිල් කිඳෙල්පිටිය |
| කේ.ඩී. අරුණ දීපාල් | මංජුල ප්‍රසන්න සම්පත් | සේනක දමයන්ත ද සිල්වා |
| ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා | මෙරිල් පෙරේරා | ශිරන්ත අමරසේකර |
| චන්දන ජයකොඩි | මොරිස් විජේරත්න | හරිස්චන්ද්‍ර කොස්තා |
| ජගත් අංගගේ | මොහොමඩ් ෆයිරූස් | හෙක්ටර් බෙත්මගේ |
| ජගත් කුමාර | මොහොමඩ් ෆායිස් | |
| ජගත් පී. විතාන | යූ.එල්.එන්.පී. උඩවෙල | |

**නොපැමිණීම :**

| | |
|---|---|
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

| | | |
|---|---|---|
| අනුරාධ විමලරත්න | කොලන්නගේ වජිර පෙරේරා | රන්දීර් රොද්‍රිගෝ |
| අමල් සිල්වා | කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය | රවී විජේසේකර |
| ඇන්ටනී උපුල් රාජිත | ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා | විජිත් ප්‍රියන්ත |
| ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා | නිමල් චන්ද්‍රරත්න | සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය |
| ඉන්දික බණ්ඩාර | නිරෝෂා අතුකෝරල මැතිනිය | සුනිල් වටගල |
| උදාර රත්නායක | නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු | සුසාර දිනාල් |
| උපාලි කොඩිකාර | මල්ෂා කුමාරණතුංග මැතිනිය | සෙනල් වෙල්ගම |
| උපාලි ගුණරත්න | මංජුල බුද්ධදාස | ශ්‍රීනාත් පෙරේරා |
| කුරුසාමි කලන්කාඩි තේවර් | රජිත හපුආරච්චිගේ | |

## 01. ගරු සභාපතිතුමාගේ නිවේදනය :

*i*

*"පාර්ලිමේන්තුවෙන් එවා ඇති ධීවර හා ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කර මෙම පළාත් සභාවේ අදහස්, මාර්තු මස 17 දින හෝ ඊට පෙර පාර්ලිමේන්තුවේ මහ ලේකම් වෙත දන්වා යැවිය යුතු බව ගරු සභාපතිතුමා විසින් සභාවට දන්වන ලදී."*

*ii*

*"මෙම පළාත් සභාවේ දීර්ඝ කාලයක සිට එනම්, පළාත් සභාව ආරම්භක කාලයේ පටන් පසුගිය පෙබරවාරි මස 23 වැනි දින පැවැති සභා රැස්වීම දක්වා වූ දීර්ඝ කාලයක සිට මෙම පළාත් සභා රැස්වීම් ජනමාධ්‍ය ඔස්සේ වාර්තාකරණයේ යෙදුණු ජ්‍යෝෂ්ට මාධ්‍යවේදී වයිමන් හෙට්ටිආරච්චි මහතා පසුගිය සභා රැස්වීම් දිනට පසු දින (24 දා) හදිසියේ අභාවප්‍රාප්ත වූ බව ගරු සභාපතිතුමා විසින් සභාවට දන්වන ලදී."*

*iii*

*කාරක සභාව පත් කිරීම :*

*"**පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ** හිස් වූ පුරප්පාඩු සාමාජික තනතුරු දෙක සඳහා 2016.02.24 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රදීප් උඳුගොඩ ගරු මන්ත්‍රීතුමා සහ අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමාව සහ;*

***මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පරිපාලන හා පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන සහ ජලපවාහන සහ සංචාරක අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ** එම්.එස්.එම්. ෆයිරෝස් ගරු මන්ත්‍රීතුමා වෙනුවට මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමාත්,*

***අධ්‍යාපන, සංස්කෘතික, කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ** මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා වෙනුවට එම්.එස්.එම්. ෆයිරෝස් ගරු මන්ත්‍රීතුමාත්*

*2016.03.08 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලද බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.*

## 02. කාරක සභා වාර්තා :

2016.02.26 වන දින පැවැති ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව [කාරක සභාවේ සභාපති වෙනුවෙන්] රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කරන ලදී.

අනතුරුව, 2016.02.24 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

## 03. නොපැමිණ සිටීමේ අවසරය :

*"උපාලි ගුණරත්න ගරු මන්ත්‍රීතුමාට මාසයක කාලයක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි ගුණසිරි ජයනාත් - ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත විය."*

***පූ.භා. 11.09 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

## 04. පළාත් සභාවේ රැස්වීම :

සුමිත් ලාල් මෙන්ඩිස් ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද *"මීළඟ පළාත් සභාව 2016.03.23 දින පෙ.ව. 09.30 ට රැස්විය යුතුය"* යන යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් පළ කළ අදහස් හා එකඟත්වය මත සුනිල් ජයමිණි ගරු සභානායකතුමා විසින් අනතුරුව ඉදිරිපත් කරන ලද යෝජනාව වන *"අද දින (2016.03.08) විසිර යෑමෙන් අනතුරුව මෙම පළාත් සභාව 2016.03.21 වන සඳුදා දින රැස් විය යුතුය"* යන යෝජනාව සභා සම්මත විය.

## 05. ධීවර හා ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත :

ලලිත් වනිගරත්න ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද *"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් යොමු කරන ලද ධීවර හා ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත"* පිළිබඳ යෝජනාව සභා සම්මත විය.

## 06. රීති අංක 107 යටතේ යෝජනාව :

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලදුව, අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනා සභා සම්මත විය.

*"පොදු වැදගත්කමකින් යුක්ත වූද, හදිසි වූද පහත සඳහන් වන යෝජනාවන් සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හා ඊට ආනුෂංගිකව කාර්ය පටිපාටි රීති 8(5), 8(6), 15(2), 15(5), 53(2), 53(3), 57(2),57(3) හා 57(5) යන රීතීන් අත්හිටිවූය යුතු යැයි යෝජනා කරමි."*

## 07. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව I : වහාම තෙල් මිල අඩු කිරීමට පියවර ගන්නා ලෙස මධ්‍යම ආණ්ඩුවට යෝජනා කිරීම.

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී.

*"මේ වනවිට ලෝක වෙළඳ පොලේ තෙල් මිල ඉතාම සීඝ්‍රයෙන් පහළ බැස තිබෙනවා. 2014 ජුනි මස බොරතෙල් බැරලයක් ඇමෙරිකානු ඩොලර් 108.06 ක් වූ අතර, අද වන විට එය ඩොලර් 26.81 ක් දක්වා ප්‍රමාණයකට අඩු වී තිබෙනවා. එසේම 2014 ජුනි මාසයේදී පෙට්‍රල් බැරලයක මිල ඇමෙරිකානු ඩොලර් 120.39 ක් වූ අතර, අද වන විට ඇමෙරිකානු ඩොලර් 46.89 ක් දක්වා පහත බැස තිබෙනවා. ඩීසල් බැරලයක මිල 2014 ජුනි මාසයේදී ඇමෙරිකානු ඩොලර් 121.24 ක් වූ අතර, අද වන විට ඇමෙරිකානු ඩොලර් 35.18 ක් දක්වා පහත බැස තිබෙනවා. ජීවන බරින් මිරිකී සිටින ජනතාවට එහි සහනය ලැබිය යුතු වුවත්, මධ්‍යම ආණ්ඩුව එය දිගින් දිගටම නොසලකා හැරීම පිළිබඳව නොසතුට පළ කරන අතර, වහාම තෙල් මිල අඩු කිරීමට පියවර ගන්නා ලෙස බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කර සිටී."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***අ.භා. 01.09 ට ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 08. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව II : කාන්තාවන් ප්‍රමුඛ සමස්ත ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට පාතාලයේ අනීතික ක්‍රියාකාරකම් මැඩලන ලෙස ඉල්ලා සිටීම.

රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කරන ලදුව, අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"ජාත්‍යන්තර කාන්තා දිනය අදට යෙදී තිබේ. පාතාලයට සම්බන්ධ පිරිසක් විසින් ගර්භනී කාන්තාවකට වෙඩි තබා ඇත. තවද, ප්‍රදේශ ගණනාවක පාතාල පිරිස් විසින් වෙඩි තැබීම් ගණනාවක් සිදු කර ඇත. මෙම වෙඩි තැබීම් වල සිද්ධිමය පසුතලයන් කුමක් වුවද මෙම පාතාලය හිස එසවීම වහා මර්දනය කළ යුතුව තිබේ. එසේම අවුරුදු 16 ට අඩු ළමුන් 1561 ක් පසුගිය වසර තුළ පමණක් දූෂණයට ලක් වී තිබේ. මෙලෙස අයුතු හා*

*අසාධාරණ ලෙස දූෂණයට සහ භීෂණයට ලක්වන කාන්තාවන්ගේ මෙන්ම සමස්ත ජනතාවගේම අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් මෙම පාතාලය හිස එසවීම පිළිබඳ වහා අවධානය යොමු කර පාතාලයේ අනීතික ක්‍රියාකාරකම් මැඩලීමට ඉක්මන් පියවර ගත යුතු යැයි මෙම පළාත් සභාව පොලිස්පතිවරයා ප්‍රමුඛ ආරක්ෂක අංශ වලින් සහ රජයෙන් ඉල්ලා සිටී."*

## 09. කල් තැබීම :

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා **[**ගරු ලලිත් එල්ලාවල මහතා**]** විසින් පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 02.59 ට, 2016 මාර්තු මස 21 වන සඳුදා දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2016.03.09
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

පූර්/09
Minuts 2016.03.09 - Hansard Section